# <u>මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>

## <u>2022 පෙබරවාරි 17 වන දින</u>

### ❖ 08 වන සැසි වාරයේ 46 වන සභා වාර්තාව

**දිනය :- 2022.02.17 වන දින**

**වේලාව :- පෙ.ව.10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

<u>පැමිණීම</u>

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02.ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනාත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.ම. ඕංගෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම. ටී.සී. ඉන්දික මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. කේ. රන්ජන් වීරසේකර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. සුගත් සරණිගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එම්.ඒ. ගාමිණි සංජීව | පෙ.ව. 10.00 |
| 20.ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |

| | |
|---|---|
| 21.ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් | පෙ.ව. 10.00 |
| 22.ගරු ප්‍රා.ස.ම. රමනි ගල්පෙ ගමගේ මැතිනිය. | පෙ.ව. 10.00 |
| 23. ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 24. ගරු ප්‍රා.ස.ම. එන්.ඒ.එස්. වීරසිරි මැතිනිය. | පෙ.ව. 10.00 |
| 25. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 26.ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්මසිරි මැතිතුමා. | පෙ.ව. 10.00 |

<u>නොපැමිණීම</u>

01. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිනිය.

02. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිනිය.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දුල මයා.

02. කළමනාකරණ සේවා නිළධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

<u>**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**</u>

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණ සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කවුඩන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ පෙබරවාරි මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වූ ගරු උපසභාපතිතුමන්, හිටපු සභාපතිවරුන් දෙපළ , මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වූ ලේකම් තුමා ඇතුළු නිලධාරිතුමියන්, මාධ්‍යවේදි තුමන්ලත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

<u>**01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.**</u>

2022 ජනවාරි මස 20 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියවූවා සේ සලකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම:ජේ.ඒ.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

නිහඬතාවයෙන් පෙනී යන්නේ පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව සංශෝදන රහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 ජනවාරි මස 20 වන දින පැවති මහ සභා රැස්වීමේ සංශෝදිත වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන** - නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 – 1. ආධාර මුදලක් ලබා ගැනීම සඳහා**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ආධාර මුදලක් ලබා දීම සම්බන්ධවයි මැයෙන් කිරම, වල්ගම්මුල්ල, නාමල්ගම ලිපිනයෙහි පදිංචි ජ්.එම්.නිමල් ශාන්ත මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහුගේ බිරිඳ වන එච්.ඩබ්.චාන්දනී හේමසිරි යන අය සඳහා හදිසි ශල්‍ය කර්මයක් සිදුකර කරාපිටිය ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබන බැවින් ඒ සඳහා ආධාර මුදලක් ඉල්ලුම් කර ඇත. ඇයගේ රෝගී තත්වය අනුව අදාළ ලිපිලේඛන ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත ලබා දෙන රු.5000.00ක කරුණා සහගත දීමනාව ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

අපි සභාවෙන් මේ අය සඳහා දීමනාවක් ලබා දෙනවා නේද? ඒක ලබා දෙන්න පුළුවන්.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මේ අයගේ රෝගී තත්වය තහවුරු කරන්න අවශ්‍ය ලිපි ලේඛන ගෙන්වා ගෙන අදාල පරිදි අනුමැතියට යවන්න. කැලුම් මන්ත්‍රීතුමන් මේ අය ගැන දන්නවා. ඒ පිළිබඳ සොයා බලන්න.

ඒ අනුව කිරම, වල්ගම්මුල්ල, නාමල්ගම ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්.චාන්දනී හේමසිරි යන අය සඳහා හදිසි ශල්‍ය කර්මයක් සිදුකර කරාපිටිය ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබන බැවින් ඒ සඳහා අදාළ ලිපිලේඛන ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත ලබා දෙන රු.5000.00ක කරුණා සහගත දීමනාව ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

**05 – 2. සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට නිර්දේශය ලබා ගැනීම**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට නිර්දේශය ලබා ගැනීම මැයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් තුමන්ගේ අංක බෞකො/විහාදේ/09/24/010 හා 2022.01.04 දිනැතිව යොමු කර ඇති ලිපියට අනුව මිද්දෙණිය පුරාණ මහා විහාරස්ථානයේ නගරයට ආසන්න ඉඩම් කොටසෙහි දායක සභාව විසින් මූල්‍ය ප්‍රතිපාදන යොදවා සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ සඳහා අදාළ සැලැස්ම සකස් කොට ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත දන්වා යැවීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරනු ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මිද්දෙණිය පුරාණ විහාරස්ථාන භූමියේ වාණිජමය වටිනාකමක් ඇති සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය අදාළ කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලැබිලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් නැහැ. නමුත් අදාළ සැලසුම් සකස් කරලා එය ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන්න අවශ්‍ය බව දන්වමු.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

අපි මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගන්නත් අවශ්‍යද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, නගර සීමාව තුළ නිසා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය අවශ්‍යයි.

ඒ අනුව මිද්දෙණිය පුරාණ මහා විහාරස්ථානයේ නගරයට ආසන්න ඉඩම් කොටසෙහි දායක සභාව විසින් මූලික ප්‍රතිපාදන යොදවා සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට අදාළ සැලැස්ම සකස් කොට ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත දන්වා යැවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ඇත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. සැලසුම් කමිටු දීමනා ගෙවීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සැලසුම් කමිටු දීමනා ගෙවීම මැයෙන් අංක කප්‍රාස 05 හා 2022.01.28 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2021.07.08 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇති ගැසට් පත්‍රයට අනුව අයකරනු ලබන පෙරසැරි ගාස්තු වැඩිකර ඇති බැවින් සැලසුම් කමිටු දීමනාවද රු.1000.00 දක්වා වැඩි කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. අපි ඒ දීමනාවන් ලබා දෙන්න කටයුතු කරමු.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ සැලසුම් කමිටු දීමනාව සභා අරමුදලින් නේද ගෙවන්නේ. නමුත් මේ සියලු දීමනාවක් අනුමත කිරීමේ බලය තිබී වන්නේ මුදල් කමිටුවට. ඒ සඳහා කිසිදු දීමනාවක් නොගෙවන්නේ ඇයිද යන්න ගැටළුවක් තියෙනවා. එහෙම ගෙවනවා නම් හොඳයි. මුදල් කමිටුවට සහභාගී වන නිලධාරින්ටත් විශාල වගකීමක් සහ කාර්ය භාරයක් තියෙනවා. එය ඇගයීමක් විදියට යම් දීමනාවක් ගෙවනවා නම් හොඳයි. මේ සඳහා ගැසට් පත්‍රයක් මගින් අනුමැතිය ලබා දීලා තියෙනවා නම් අපි ගෙවිය යුතු වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ සැලසුම් කමිටුව මගින් සභාවට ආදායම් උපයා දීමක් කරනවා. එම ආදායම් උපයා දීමත් සමග තමයි ඒ සඳහා සහභාගී වන නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඇතුළු කමිටුව වෙනුවෙන්

දීමනාවක් ගෙවන්නේ. එම පෙරහැර ගාස්තු ඉහළ යාමත් සමග තමයි එම දීමනාව ඉහළ දමන්න කියලා මේ ඉල්ලීම කරන්නේ. ඒ සඳහා අපි රු.1000.00ක මුදලක් ගෙවීමට නිර්දේශ කරමු.

ඒ අනුව සැලසුම් කමිටු දීමනාව රු.1000.00 දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4.දියර කිරි හා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය හා හරිතාගාර වගා ව්‍යාපෘතිය

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ප්‍රාදේශිය සභාව මගින් 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂිත ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන ලෙස අංක කප්‍රාස 21 හා 2022.02.07 දිනැතිව සිදු කර ඇති ඉල්ලීමට අනුව පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ මගින් ප්‍රතිපාදන ලබා ගෙන අදාල ව්‍යාපෘති යෝජනා අනුමත කරවා ගෙන ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

01.දියරකිරි හා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය

02.හරිතාගාර වගා ව්‍යාපෘතිය

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපිට මෙවැනි ව්‍යාපෘතියක් සඳහා කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ මගින් ප්‍රතිපාදනයන් ලබා ගෙන සිදු කරන්න පුළුවන් නම් හොඳයි. ඒ සඳහා අවශ්‍ය ඉඩම් සභාව සතුව තියෙනවා. ඒ වගේම අපිට කිහිප දෙනෙක් සඳහා රැකියා අවස්ථා සලසා දෙන්නත් පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙවැනි ව්‍යාපෘති සඳහා අපි අදාළ ව්‍යාපෘති යෝජනාවන් සකස් කරන්න අවශ්‍යයි නේද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, අනිවාර්යයෙන්ම ව්‍යාපෘති සඳහා අවශ්‍ය යෝජනා සකස් කළ යුතුයි. ඒ සඳහා සභා අනුමැතියක් ලබා ගැනීම සඳහා තමයි කලින් සභාවට මෙය යොමු කළේ . පසුව ඉදිරි කටයුතු කරන්න අවශ්‍යයි. පසුගිය දිනක අරලිය ගහ මන්දිරයේ සාකච්ඡාවක් සඳහා අපි සහභාගී වූ අවස්ථාවේ වැවිලි කර්මාන්ත අමාත්‍ය තුමන් ප්‍රකාශ කර සිටියේ ප්‍රාදේශිය සභා මගින් මෙම හරිතාගාර වගා ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරනවා නම් ඒ සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් මුදල් ලබා දෙන බව.

**ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙම ව්‍යාපෘති දෙකම ඉතාම හොඳයි. මෙවා ක්‍රියාත්මක කරන්නේ සභාව මගින්ද? ඒ සඳහා සභා අරමුදලින් වියදමක් නැද්ද?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

මේ සඳහා අදාළ අමාත්‍යාංශ මගින් මුදල් ලබා දෙනවා. කර්මාන්තය කරගෙන යද්දී යම් මුදලක් සභාවටත් දරන්න වෙයි. ක්‍රියාත්මක කරන්නේ සම්පූර්ණයෙන්ම සභාව මගින් සහ සභාවේ සේවකයින් යොදවලා.

ඒ අනුව දියර කිරි හා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය හා හරිතාගාර වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල අමාත්‍යාංශ මගින් ප්‍රතිපාදන ලබා ගෙන අදාල ව්‍යාපෘති යෝජනා අනුමත කරවා ගෙන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 5. පෙර පාසල් වල තීන්ත ආලේප කිරීම

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

පෙර පාසල් වල තීන්ත ආලේප කිරීම මැයෙන් අංක සංග්‍රාය 10 හා 2022.01.25 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පහත පෙර පාසල් සඳහා 2022 වර්ෂයේ නවක සිසුන් බඳවා ගැනීමට පෙර තීන්ත ආලේප කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය තීන්ත සහ ආලේපන උපකරණ තාක්ෂණ නිළධාරි නිර්දේශය මත මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01 මිද්දෙණිය ප්‍රාදේශිය සභා පෙර පාසල

02.මොරගහලගොඩ ප්‍රාදේශිය සභා පෙර පාසල

03. රණසිංහ ගොඩ ප්‍රාදේශිය සභා පෙර පාසල

04. ගල්පොතු කන්ද ප්‍රාදේශිය සභා පෙර පාසල

05. කිරම ප්‍රාදේශිය සභා පෙර පාසල

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී . කැළුම් තුෂාර හරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ කාර්යය කරන්න ඕන අවුරුද්ද පටන් ගනිද්දිම. පෙර වර්ෂයේ දෙසැම්බර් මාසය වගේ වෙද්දී මේ පෙර පාසල් වල ප්‍රතිසංස්කරණ කටයුතු කරලා අලුතින් දරුවන් භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

දැනටමත් අපි අවශ්‍ය කටයුතු කරලා තියෙන්නේ. සියලු පෙර පාසල් වල ප්‍රතිසංස්කරණ කටයුතු කරලා තමයි අලුතින් ළමයි ගත්තේ . ඒ සඳහා ගෙවීම කිරීම අවශ්‍යයි.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

දැනට අපි ගිය වර්ෂයේ ළමයින් පෙර පාසලට භාරගන්නවද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, මාර්කු වල පාසල් පටන් ගන්න තුරු ඒ ළමයින් ගෙන්නනවා.

**ගරු ප්‍රා.ස.ම. එම්.බී. සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, සභාව මගින් පාලනය වන පෙර පාසල් සඳහා සියලුම දේවල් අපි ලබා දෙනවා. අපේ බල ප්‍රදේශය තුළ ඇතැම් පෙර පාසල් ඉතා අඩු පහසුකම් යටතේ පවතිනවා. ඒවායේ ඉගෙනගන්න ළමයින්ටවත්, ගුරුවරුන්ටවත් රජයෙන් ලැබෙන දේවල් අඩුයි. ඒ නිසා මේ අයවැය මගින් යම් යම් දේවල් පෙර පාසල් සඳහා ලබා දෙන්න කටයුතු කරද්දී අනෙකුත් අඩු පහසුකම් සහිත පෙර පාසල් සඳහාද අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි හැම වර්ෂයකට අයවැය මගින් එම අඩු පහසුකම් සහිත පෙර පාසල් සඳහා අවශ්‍ය කරන යම් යම් දේවල් අරගෙන දෙන්න කටයුතු කරනවා. මේ වර්ෂයෙත් ඒ සඳහා මුදල් වෙන් කරලා තියෙනවා. හැම කොට්ඨාශයකින්ම එක් පෙර පාසලක් බැගින් තෝරලා ඒ කටයුත්ත කරනවා. පෙර වර්ෂවලත් ඒ අයුරින් ලබා දුන්නා. එම පෙර පාසල් හැර වෙනත් පෙර පාසලක් මේ වර්ෂයේ තෝරා ගන්න. ඒ සඳහා කොට්ඨාශ මට්ටමින් මන්ත්‍රීතුමන්ලා සාකච්ඡා කරලා ඒ කාර්යය සාර්ථකව කරන්න. මේ වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ විශාල ප්‍රමාණයක් පෙර පාසල් සඳහා පහසුකම් ලැබිලා තියෙනවා.

ඒ අනුව 2022 වර්ෂයේ නවක සිසුන් බඳවා ගැනීමට කටුවන ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් වල තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය තීන්ත සහ ආලේපන උපකරණ තාක්ෂණ නිලධාරී නිර්දේශය මත මිල කැඳවීම කර සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 6. මාරගහවත්ත පාර කැටගල් අල්ලා සකසා ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මාරගහවත්ත පාර කැටගල් අල්ලා සකසා ගැනීම මැයෙන් මාරගහවත්ත ප්‍රදේශවාසී ජනතාව විසින් 2022.02.01 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම මාර්ගය වළවල් හා කාණු සැදී ඉතා අබලන් තත්වයේ පවතින බැවින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිලධාරී මගින් වාර්තාවක් සකස් කර සභාවේ යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. රමණී හල්පෙගමගේ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. රමණී හල්පෙගමගේ මැතිතුමිය**

මෙම මාර්ගය ඉතාම අබලන් තත්වයේ පවතිනවා. මාර්ගයේ ගමන් කිරීමත් ඉතාම දුෂ්කරයි. ඒ නිසා ප්‍රදේශයේ ජනතාව ඉතා අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා මෙය පිළිසකර කරලා දෙන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මෙහි ගැටළුකාරී තත්වයන් තිබේනම් අපි තාක්ෂණ නිලධාරීන් ලවා ඇස්තමේන්තුවක් සකස් කරලා ඒ පාර සකස් කරමු. ඉදිරියේදී කොට්ඨාශ වලට බැකෝ යන්ත්‍රය සහ JCB යන්ත්‍රය ලබා දෙන්නම්. ඔබතුමන්ලා කොට්ඨාශ මට්ටමින් මාර්ග සංවර්ධන කටයුතු කරන්න.

ඒ අනුව මාරගහවත්ත පාර කැටගල් අල්ලා සකසා ගැනීම සඳහා තාක්ෂණ නිලධාරී මගින් ඇස්තමේන්තුවක් සකස් කර සභාවේ යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 7. 2022 අයවැය යෝජනා මගින් ලබාගත් මාර්ගයන් සංශෝධනය කිරීම - ගොමඩිය කොට්ඨාශය

**ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා**

2022 අයවැය යෝජනා මගින් ගොමඩිය කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද ගොමඩිය උඩබංගලාව මාර්ගය වෙනුවට මැදකන්ද දොළෙල්දෙනිය මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ටී.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ වර්ෂය අවසන් වීමට පෙර ඇස්තමේන්තු සකස් කරලා මේ මාර්ගය සංවර්ධනය කරන්න.

ඒ අනුව 2022 අයවැය යෝජනා මගින් ගොමඩිය කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද ගොමඩිය උඩබංගලාව මාර්ගය වෙනුවට මැදකන්ද දොළෙල්දෙනිය මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සම්බන්ධවත් ඒ සඳහා තාක්ෂණ නිලධාරී මගින් ඇස්තමේන්තු සකස් කර එම සංවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 8. 2022 අයවැය යෝජනා මගින් ලබාගත් මාර්ගයන් සංශෝධනය කිරීම - සියාරපිටිය කොට්ඨාශය

**ගරු ප්‍රා.ස.ම.ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා**

2022 අයවැය යෝජනා මගින් සියාරපිටිය කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද දඹේලන්ද මාර්ගය වෙනුවට උඩ අළුපොත්දෙනිය හැඩිගෙදර මාර්ගය සහ පහල අළුපොත්දෙනිය නිවිතිවැලයාය මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සංශෝධනය කිරීම ගැටළුවක් නැහැ. කඩිනමින් ඇස්තමේන්තු සකස් කරලා සංවර්ධන කටයුතු පටන් ගන්න.

ඒ අනුව 2022 අයවැය යෝජනා මගින් සියාරපිටිය කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරියත් කරන ලද දඹේලන්ද මාර්ගය වෙනුවට ඉඩ අළුපොත්දෙනිය හැඩිගෙදර මාර්ගය සහ පහල අළුපොත්දෙනිය නිවිතිවැලයාය මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 9. එගොඩබැද්ද වරාපිටිය ගම්සභා පාර සම්බන්ධවයි.</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

එගොඩබැද්ද - වරාපිටිය ගම්සභා පාර සම්බන්ධවයි මැයෙන් කිරම, එගොඩබැද්ද, මුහන්දිරම නිවස ලිපිනයෙහි පදිංචි එම්.ඩබ්.පී. පද්මා යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එගොඩබැද්ද සුබෝධාරාම විහාරස්ථානය ඉදිරියෙන් දිවෙන එගොඩබැද්ද වරාපිටිය පාර සංවර්ධනය කිරීම සඳහා එම මාර්ගය මැනුම් කර නිරවුල් කර දෙන ලෙස වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යවන ලෙසත් මෙම සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කළ යුතු බැවින් එම කටයුතු ප්‍රමාද වන්නේ නම් පෞද්ගලික මිනින්දෝරුවරයෙකු ලවා සභා අරමුදලින් මැනුම් කර නිරවුල් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස,ම.එම්.පී.සී.කැළුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේක අඩි 33ක පමණ පාරක්. මේ පාර අපි කපලා සකස් කළා. නමුත් පාර අවට අය වැටවල් ගහලා අයිති කර ගෙන . මෙය 1950 වර්ෂයේ ඉඩම් හිමියන්ට වැව්ල්ලට වන්දි ගෙවලා සභාවට පවරලා ගත්තු ඉඩමක්. ඊට අදාළ ගැසට් පත්‍රයක් තියෙනවා. ඒ නිසා මේක මැනලා නිරවුල් කරලා දෙන්න කියලා ප්‍රාදේශීය ලේකම් තුමන්ට යවමු. ඒ කාර්යය ප්‍රමාද වෙනවා නම් අපි මිනින්දෝරුවෙක් ලවා මැනුම් කර සභා අරමුදලින් ගෙවීම කර මාර්ගය නිරවුල් කර ගනිමු.

<u>ගරු ප්‍රා.ස.ච.ඒම්.බී.සුගතදාස මැතිතුමා</u>

මේ මාර්ගයේ එහා කොටසද? මේ මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉඩමක් අත්පත් කරන්න කථා කළා නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ පන්සල ඉදිරිපස කොටසක්. කලින් කථා කරන ලද ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා.

ඒ අනුව එගොඩබැද්ද - වරාපිටිය ගම්සභා පාර සංවර්ධනය කිරීම සඳහා එම මාර්ගය මැනුම් කර නිරවුල් කර දෙන ලෙස වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යවන ලෙසත් මෙම සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කළ යුතු බැවින් එම කටයුතු ප්‍රමාද වන්නේ නම් පෞද්ගලික

විනිශ්චේරුවරයෙකු ලවා සහා අරමුදලින් මැනුම් කර නිරවුල් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 10. කටුවන පොදු වෙළඳපොළ ඇතුළත කඩ කාමර සම්බන්ධවයි

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන පොදු වෙළඳපොළ ඇතුළත කඩ කාමර සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.02.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන පොදු වෙළඳපොළ නව පොළ භූමියට රැගෙන යාම හේතුවෙන් එම ස්ථානයේ පොළ නොපැවැත්වීම මත අදාල කඩ කාමර වල 2022 පෙබරවාරි මස සිට දැනට අය කරනු ලබන මාසික බදු කුලී අය කිරීමෙන් නිදහස් කිරීම සුදුසු බවත් නව පොළ භූමියෙහි කඩිනමින් තාක්ෂණ නිලධාරි නිර්දේශ මත සභා අරමුදලින් අදාල කඩ කාමර සකස් කර කඩ හිමියන්ට ලබා දීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම.පී.කොඩිතුවක්කු මැතිතුමා</u>

සභාපතිතුමණි, ඇතැම් අය කඩ කාමර ගත්තත් පවත්වා ගෙන යන්නේ නැහැ. ඒ පිළිබඳ සොයා බලන්න ඕන.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි කඩ කාමර 10ක් තිබුණ නිසා 10ක් අලුතින් හදන්න වෙනවා. අපි ඒ කඩ කාමර ලබා දෙන කොට අවශ්‍ය අයට ලබා දෙමු. පරණ පොළ ඉවත් කිරීමත් සමග එතන තිබූ කඩ කාමර වෙනුවට අපි අලුත් කඩ කාමර 10ක් සහ ආපනශාලාවක් සකස් කරලා දෙන්න අවශ්‍යයි. ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරමින් තියෙන්නේ.

<u>ගරු ප්‍රා.ස.ම.ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙතන පොළ නොපැවැත්වීම නිසා කඩ හිමියන්ගෙන් බදු කුලී අය කරන්නත් බැහැ නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්, පොළ නොපැවැත්විම මත බදු කුලී අය කිරීම කරන්න බැහැ. එයින් නිදහස් කරන්න වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

සභාපතිතුමණි, දැනට කටුවන පොළ කඩ කාමර ලබා දීම පිළිබඳ කිසිදු ගැටළුවක් නැද්ද? සියල්ල දීලා ඉවරද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, දැනට සියල්ල දීලා අවසන්. පැරණි පොළ භූමියෙහි තාවකාලිකව වාහන නවත්වන්න දෙනවා. නමුත් ඉදිරියේදී ටෙන්ඩරයක් මඟින් එය සම්පූර්ණයෙන් ඉවත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව කටුවන පොදු වෙළඳපොළ නව පොළ භූමියට රැගෙන යාම හේතුවෙන් එම ස්ථානයේ පොළ නොපැවැත්වීම මත අදාළ කඩ කාමර වල 2022 පෙබරවාරි මස සිට දැනට අයකරනු ලබන මාසික බදු කුලී අය කිරීමෙන් නිදහස් කිරීම සම්බන්ධවත් නව පොළ භූමියෙහි කඩිනමින් තාක්ෂණ නිලධාරී නිර්දේශ මත සහා අරමුදලින් අදාල කඩ කාමර සකස් කර කඩ හිමියන්ට ලබා දීම සම්බන්ධවත් විවාධික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 11. 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මහ සභාව වෙත ඉදිරිපත් කිරීම මැයෙන් අංක කප්‍රාස 19/ ස්ථාවර වත්කම් හා 2022.02.11 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021 වර්ෂයට අදාළව කටුවන ප්‍රාදේශීය සභාවට අදාළව පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවත් ඊට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සහ තක්සේරු කමිටුව පහත සංයුතියෙන් යුතුව පත් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

<u>භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව</u>

01.ගරු මහජන නියෝජිතවරුන් - 03

02.ලේකම් - කටුවන ප්‍රාදේශීය සභාව

03.ප්‍රජා සංවර්ධන නිලධාරී

04.තාක්ෂණ නිලධාරී

05.ආදායම් පරීක්ෂක තුමිය - මිද්දෙනිය

06.හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරියෙකු

07.ගබඩා භාරකරු

<u>තක්සේරු කමිටුව</u>

01.ලේකම් - කටුවන ප්‍රාදේශීය සභාව

02.තාක්ෂණ නිලධාරී

03.ආදායම් පරීක්ෂක නිලධාරිතුමිය

04.අභ්‍යන්තර විගණන නිළධාරී

05.ගබඩා භාරකරු

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී අපි දැකපු දෙයක් තමයි පුස්තකාල වල පොත් පත් සහ විශේෂයෙන්ම පුවත් පත් පරිහරණය ඉතාම අඩු මට්ටමක පවතින බව . මීට පෙර ළඟිං වැඩිහිටි සියලු දෙනාම පුස්තකාලයට ඇවිත් පුවත්පත් බැලීමට පුරුදුව සිටීමත් එක්ක පුස්තකාල පරිහරණය සතුටුදායි මට්ටමක තිබුණා. නමුත් අද බොහෝ දෙනෙක් දුරකථන භාවිතයත් සමග පුවත් පත් පරිහරණය අඩුවෙලා. මිලදී ගත් පුවත්පත් ඒ ආකාරයෙන්ම දකින්න පුළුවන්. අපිට භාණ්ඩ සමීක්ෂණ වලදී පුස්තකාල පොත් ගණනය කිරීම කරනවා . සෑම වර්ෂයකම විශාල පොත් ප්‍රමාණයක් අලුතින් ගන්න අනුමැතිය ලබා දෙනවා. මේවා පරිහරණය කිරීම සම්බන්ධව පාසල් මට්ටමින් හෝ උපකාරක පන්ති මට්ටමින් හෝ දැනුවත් කරනවා නම් හොදයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ පුස්තකාල භාවිතය පිළිබඳ සමාජය දැනුවත් කරන්න අපි ෆේස් බුක් හරහා පණිවුඩ යවනවා. නමුත් ඒ සදහා දක්වන ප්‍රතිචාර හරිම අඩුයි. අපි මේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න ගිය වර්ෂයේ පත් කරන ලද කමිටුවම නැවත පත් කරමු.

ඒ අනුව 2021 වර්ෂයට අදාළව කටුවන ප්‍රාදේශිය සභාවට අදාළව පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සම්බන්ධවත් ඊට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සදහා පහත කමිටු පත් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටුව</u>

01.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා

02.ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

03.ගරු ප්‍රා.ශ.ම.මානෙල් දිසානායක මැතිතුමිය

04.ලේකම් - කටුවන ප්‍රාදේශිය සභාව

05.ප්‍රජා සංවර්ධන නිළධාරී

06.තාක්ෂණ නිළධාරී - ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා

07.ආදායම් පරීක්ෂක - එම්.ටම්පිකා චතුරානි මිය

08.හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙකු

09. ගබඩා භාරකරු

<u>තාක්ෂේරු කමිටුව</u>

01.ලේකම් - කටුවන ප්‍රාදේශීය සභාව

02.තාක්ෂණ නිළධාරි- ඩබ්.ආර්.කුමාර මයා

03.ආදායම් පරීක්ෂක නිලධාරි - එම්.ජේ.වී.චතුරිකා මිය

04.අභ්‍යන්තර විගණන නිළධාරී

05. ගබඩා භාරකරු

## 06. කාරක සභා වාර්තා

### 06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.02.08 වන දින

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2022.02.08 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 93 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් අංක 01 යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 01. | එම්.ජේ.වී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 4000.00 |
| 02. | එම්.ජේ.වී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් ගමන් වියදම් | 446.00 |
| 03. | එස්.ජේ.ජී.ගුණරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3248.00 |
| 04. | ජේ.වී.එම්.රුචිර ප්‍රියංකර මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7832.00 |
| 05. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 16406.00 |
| 06. | ජී.එම්.නිහාල් මහින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 15278.00 |
| 07. | සමීර සම්පත් මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 5308.00 |
| 08. | බී.ඩී.ඩී.චමිල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6866.00 |
| 09. | කේ.කේ.රාමචන්ද්‍ර මයා, ජල වැද්දුම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 1623.00 |
| 10. | රොෂාන් ඉන්දුජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 10555.00 |
| 11. | රෝහිත ඩිල්ෂාන් මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම- | 2399.00 |
| 12. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4888.00 |
| 13. | අමිල සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2172.00 |

| | | | |
|---|---|---|---|
| 14. | ජේ.පී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8956.00 |
| 15. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 13270.00 |
| 16. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 15933.00 |
| 17. | ආරියරත්න මුතුකුමාරණ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 765.00 |
| 18. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 1777.00 |
| 19. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2178.00 |
| 20. | පුෂ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9250.00 |
| 21. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2515.00 |
| 22. | ඒ.එස්.ඒ.ශ්‍රීකාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 12385.00 |
| 23. | කේ.කේ.නාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 24. | ජී.සමීර මධුෂංක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2620.00 |
| 25. | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4739.00 |
| 26. | කේ.එච්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | LL-6446 අංක දරන ටිපර් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම | 3800.00 |
| 27. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | PF-7414 දරන කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් | 16090.00 |
| 28. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2021 IV වන කාර්තුව සඳහා මුද්දර බදු මුදල් ප්‍රේෂණය කිරීම | 64875.00 |
| 29. | කවිඳු දිනේෂික මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 30. | කවිඳු දිනේෂික මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 5950.00 |
| 31. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | 53-1634 දරන කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් | 15090.00 |
| 32. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් පොළ අධීක්ෂණ දීමනා ගෙවීම | 3000.00 |
| 33. | එම්.චමනිකා චතුරාණි මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් පොළ අධීක්ෂණ දීමනා ගෙවීම | 3000.00 |
| 34. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල | 9136.00 |
| 35. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 14700.00 |
| 36. | අයි.ජී.මහින්ද හැතිඳුම,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 14000.00 |
| 37. | සාමාන්‍යාධිකාරී, සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය, විරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම සඳහා 2022.01.01 සිට 2022.01.13 දක්වා ඉන්ධන බිල ගෙවීම | |

| | | | |
|---|---|---|---|
| | | • 227-5870- ඩීසල්-150L<br>• RE-9230-ඩීසල්-35L<br>• RE-8995-ඩීසල්-82L<br>• RB-3498- ඩීසල්-73 L<br>• PF-7414-ඩීසල්-185L<br>• Py-2590- ඩීසල්-50 L<br>• ZA -2978-ඩීසල්-280 L<br>• LK-9589-ඩීසල්-90L<br>• 75-3743- ඩීසල්-6L<br>• 252-6508-ඩීසල්-196 L<br>• RC-7796-ඩීසල්-42L<br>• LL-7399-ඩීසල්-85L<br>• BAK-9907-පෙට්‍රල්-10L<br>• LL-6446-ඩීසල්-95L<br>• ගබඩාව-පෙට්‍රල්-20L<br>• RC-5539-ඩීසල්-40L<br>• MG-330-ඩීසල්-160L | 195159.00 |
| 38. | ජේ.ඒ.අනුර මයා,සිතාරා,මහින්ද නාහිමි මාවත,මීද්දෙනිය | 2021 වර්ෂයේ මීද්දෙනිය රථවාහන නැවතුම් බදු අය කිරීම ටෙන්ඩරය ලබා ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 3000.00 |
| 39. | එන්.සී.ඩබ්.දිසානායක මය,1/A, මහින්ද නාහිමි මාවත,මීද්දෙනිය | 2021 වර්ෂයේ මීද්දෙනිය උතුර වැවගේන කජුගස්කොරටුව ඉඩමේ පොල් වලදාව ටෙන්ඩරය ලබා ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද 25% ආරක්ෂිත ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 300.00 |
| 40. | නයනෝක් ට්‍රේඩ් කම්බයින් (පුද්)සමාගම,කල්අරම,කඹුරුගමුව ,මාතර | MG-330 මෝටර්ග්‍රේඩරයට අවශ්‍ය ලොක් රින්ග් එකක් මිලදී ගැනීම | 37800.00 |
| 41. | මන්.එස්.එස්.සී.සමරසිංහ මයා ,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | RB-3498 ට්‍රැක්ටරය වාර සේවාව කිරීම වෙනුවෙන් | 15520.00 |
| 42. | රත්නායක ටයර් හවුස්,වලස්මුල්ල පාර,මීද්දෙනිය | LL-6446 අංක දරන ටීපර් රථයට අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන්<br>• 900-20 GT ටයර් 02-රු 96000.00<br>• 900-20 GT ටයර් සඳහා ටියුබ් 02-රු7600.00<br>• 20 Tape 01-රු 600.00<br>• ටයර් මාරු කිරීමට අදාළ සේවා ගාස්තු-රු600.00 | 104800.00 |
| 43. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 7000.00 |
| 44. | කේ.එච්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 6950.00 |
| 45. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 53-1364 කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 15000.00 |

| | | | |
|---|---|---|---|
| 46. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 53-1364 කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීමට ගත් අත්තිකාරම් මුදලක පියවීම | 10800.00 |
| 47. | පළාත් පාලන ආයතනයන්ගේ සංසදය | 2022 වර්ෂයේ සාමාජික මුදල් ගෙවීම | 15000.00 |
| 48. | රන්දික ඉලෙක්ට්‍රොනික් ඇන්ඩ් බැටරි සෙන්ටර්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | ZA-2978 බැකෝ යන්ත්‍රයට හා LL-7399 ජල බවුසරයට 90A බැටරියක් හා 100A බැටරි දෙකක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 83300.00 |
| 49. | එම්.ජී.චන්ද්‍රජිත් මයා | කටුවන පොල විවෘත කිරීමේ කටයුතු සඳහා මිලදී ගත් ද්‍රව්‍ය හා උපකරණ වෙනුවෙන් මුදල් ගෙවීම | 4305.00 |
| 50. | එම්.පී.අමරසේන මයා,කටුවන ප්‍රාදේශීය සභාව | ජල බිල්පත් බෙදීමේදී 2021 නොවැම්බර් මස ජල බිල්පත් දෙසැම්බර් මස බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව | 1000.00 |
| 51. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 8195.00 |
| 52. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 13420.00 |
| 53. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව. | 2022 වර්ෂය සඳහා සුළු මුදල් ලබා ගැනීම | 25000.00 |
| 54. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | කිරම උප කාර්යාලය සඳහා සුළු මුදල් ලබා ගැනීම | 5000.00 |
| 55. | ලියනගේ කන්ස්ට්‍රක්ෂන්, බිංගම, අඟුණුකොළපැලැස්ස | මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2021 කටුවන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම | 4467244.41 |
| 56. | පී.එස්.පී.කන්ස්ට්‍රක්ෂන්, ගල්පොත්තයාය,මුලම්පිටිය | හෙල්ලල නුහල අංගනය සංවර්ධනය කිරීම | 3334540.89 |
| 57. | සෙනොශ් ඉලුඩ් නාම්බිඩියන් පුද් සමාගම,තල් අරඹ,කඹුරුගමුව,මාතර | ZA-2978 බැකෝ යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම | 16599.00 |
| 58. | එල්.ජී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන පෙර පාසල්වලට අවශ්‍ය උපකරණ හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 30000.00 |
| 59. | කේ.ජී.රම්‍යසිරි සඳරුවන් මයා, සංවර්ධන නිලධාරි,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි ගමන් වියදම් | 3690.00 |
| 60. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණ සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස නිවාඩු දින වැටුප් | 7760.00 |
| 61. | ඩබ්.ආර්.කුමාර මයා, තාක්ෂණ සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස නිවාඩු දින වැටුප් | 8538.75 |
| 62. | කේ.ජී.ටී.හර්ෂණී මිය, තාක්ෂණ සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස නිවාඩු දින වැටුප් | 7760.00 |
| 63. | එල්.ජී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීම | |

| | | | |
|---|---|---|---|
| | | • ඇඳි පුටු නිපෝන් ප්ලාස්ටික් 48-රු48000.00<br>• පුස්තකාල කබඩ් වානේ 03-රු52500.00<br>• කාර්යාල මේස (පියෙස්ට්‍රා)01-රු12500.00<br>• කැරකෙන පුටු (පියෙස්ට්‍රා)01-රු9300.00<br>• බිත්ති විදුලි පංකා 01-රු5750.00<br>• ස්ටෑන්ඩ් විදුලි පංකා01-රු8900.00<br>• ජීවර් ජෝගු(1.8L)01-රු1450.00<br>• පිරිසි කෝප්ප(6Pcs)02 -රු3500.00<br>• බිත්ති ඔරලෝසු 03-රු3300.00<br>• ලිපි කබඩ් 4×3 (වානේ)01-රු10500.00<br>• රෙදි කාපට් 04-රු400.00<br>• මේස රෙදි මීටර් 01 රෙදි 12-රු2880.00<br>• ජනෙල් රෙදි යාර 01 රෙදි 3 ½-රු1365.00<br>• මේ ලැලි 01-රු590.00<br>• රබර් පාපිසි 02-රු1000.00<br>• මල් වාස් (ප්ලාස්ටික්)03-රු270.00<br>• පොත් රාක්ක (වානේ)-රු7800.00 | 170005.00 |
| 64. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022.01.25 පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනා ගෙවීම | 4500.00 |
| 65. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022.01.26 පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනා ගෙවීම | 5250.00 |
| 66. | එන්.පී.ජී.ඉන්දික මයා, පත්තිමුල්ල, පනාමගොඩ, ගොළුව, ගාල්ල | කුලී පදනම මත කටුවන ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු සඳහා යොදා ගැනීමට ලබාගත් SP-PY-2590 දරණ ඩීමෝ බට්ටා වාහනය සඳහා මාසික කුලී මුදල ගෙවීම(2022 ජනවාරි මාසය සඳහා) | 40000.00 |
| 67. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණ සේවා නිලධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | මිද්දෙනිය පොලිස් ස්ථානයේ වැසිකිළි අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු සකස් කිරීම සහ අධීක්ෂණය | 11679.00 |
| 68. | ජී.පී.එච්.ප්‍රියන්ත මයා,ශාන්ත්‍රිය බැටරි සෙන්ටර්,හුංගම පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු RC-7796 අංක දරන ට්‍රැක්ටරය සඳහා Amaron 90A බැටරියක් අළුතින් යොදා සවි කිරීම | 27900.00 |
| 69. | සී/ස වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතිය,රාජපක්ෂ වෙළඳ සංකීර්ණය,මිද්දෙනිය | සභාවට අවශ්‍ය කිරිපිටි 15kg හා සුදු සීනි 8kg ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 19085.00 |
| 70. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | කිරම මහජන පුස්තකාලයේ 2022 ජනවාරි පුවත්පත් බිල | 8140.00 |

| | | | |
|---|---|---|---|
| 71. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූර්ණය කිරීම | 24594.00 |
| 72. | එම්.දිනුජින් රත්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 73. | එම්.දිනුජින් රත්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස රජයේ නිවාඩු දිනයන්හි රාජකාරි ඉටු කිරීමට අදාලව දින දෙකක් සඳහා ගෙවීම | 3104.00 |
| 74. | ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් සඳහා උපකරණ ලබා දීම සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්මේ ප්‍රධාන වශයෙන් ලැබී ඇති මුදලින්. වියදම් වූ මුදල හැර ඉතිරි මුදල සභා අරමුදලට බැර කිරීම | 165.00 |
| 75. | සාමාන්‍යාධිකාරී,බි/ස විවිධ සේවා සමුපකාර සමිතිය,විරකැටිය | 2022.01.18 සිට 2022.01.31 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• BAK-9907-පෙට්‍රල්-10L<br>• 252-6508-ඩීසල්-185L<br>• PF-7414-ඩීසල්-192L<br>• 227-5870- ඩීසල්-96L<br>• 227-5870- බ්‍රේක් ඔයිල්-250ml<br>• RC-7796-ඩීසල්-70L<br>• LK-9589-ඩීසල්-140L<br>• RE-9230-ඩීසල්-60L<br>• ගමබඩාව-පෙට්‍රල්-40L<br>• RE-8995-ඩීසල්-70L<br>• RB-3498- ඩීසල්-73 L<br>• MG-330-ඩීසල්-430L<br>• ZA-2978-ඩීසල්-380L<br>• ZA-2978-සොල්වෙන්ට්-100ml<br>• 53-1634-ඩීසල්-135 L<br>• Py-2590- ඩීසල්-30 L<br>• SNH-2011153-ඩීසල්-50 L<br>• LL-6446-ඩීසල්-70L<br>• RE-5539-ඩීසල්-80L<br>• 270-0429-ඩීසල්-20 L<br>• 270-0429-එන්ජින් ඔයිල්-04 L | 264804.00 |
| 76. | එස්.බී.අනුර මයා,සංවර්ධන නිළධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයට ගෙවීම සඳහා ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් වල ගුණාත්මකභාවය පිළිබඳ තත්ව සහතිකයක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 6350.00 |
| 77. | ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව,94,පරණ කොට්ටාව පාර,නාවින්න,මහරගම | 2022 වර්ෂයේ 1 වන කාර්තුව සඳහා ආයුර්වේද ඖෂධ ලබා ගැනීම සඳහා වූ මුදල | 556630.00 |
| 78. | ජී.ආර්.රශ්මි රවීනා මිය, පැලුහේන, කැකිරිඔබඩ, කිරම | කටුවන ප්‍රාදේශීය සභාවේ වරිපනම් ප්‍රතිශෝධන කටයුතු වෙනුවෙන් 2020.09.03 සිට 2021.04.29 දිනා | |

| | | | |
|---|---|---|---|
| | | දක්වා සහභාගී වීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 163200.00 |
| 79. | ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | ඩබ්.කේ.දහනායක මයා විසින් මිද්දෙනිය බස් නැවතුම්පොළ පොදු වැසිකිළියෙහි ටෙන්ඩරය ලබා ගැනීම වෙනුවෙන් 2021 ජූලි මස දක්වා අය විය යුතු හිඟ ජල ගාස්තුව 25 % ආරක්ෂිත ඇප තැන්පත් මුදලින් හා 2019,2021 වර්ෂවල ටෙන්ඩර් තැන්පත් මුදලින් අය කර ගැනීම | 9753.00 |
| 80. | ඩබ්.කේ.දහනායක මයා,සංඝනාම් ගෙදර,වතුකන්ද,කටුවන | 2021 වර්ෂයේ මිද්දෙනිය බස්නැවතුම්පොළ ටෙන්ඩරය ලබා ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදලින් හිඟ ජල ගාස්තුව අය කර ඉතිරි මුදල නිදහස් කිරීම | 1781.46 |
| 81. | ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 වර්ෂයේ ජනවාරි මස මිද්දෙනිය බස්නැවතුම්පල පොදු වැසිකිළිය බදු අය කිරීම කටුවන ප්‍රාදේශීය සභාව මගින් සිදු කළ බැවින් එම මාසයේ ජල බිල්පත ප්‍රදේශීය සභා අරමුදලින් අය කර ගැනීම | 405.00 |
| 82. | කේ.ශී අතුර මයා,සංවර්ධන නිලධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2021 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 6200.00 |
| 83. | එම්.දිනුෂීන් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම | 5950.00 |
| 84. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, හම්බන්තොට | අ.ග.බි.194 අංගලකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 01 ප්‍රමාණ වූ මහගේන නැමති සුසානභූමිය මැනුම් කටයුතු කිරීම සඳහා මුදල හා 15% වැට් මුදල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත යැවීම | 16829.29 |
| 85. | පී.එස්.පී.කන්ස්ට්‍රක්ෂන්,අංක 08,ගල්පොත්තයාය,ජුලම්පිටිය | ශෙනමෂපොස්ට අංගනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා ඇප තැන්පත් කල මුදල නැවත ලබා ගැනීම<br>• ලංසු ඇපකරය සඳහා- රු.25000.00<br>• කාර්ය සාධන ඇප තැන්පතුව- රු.172924.68 | 197924.68 |
| 86. | ලියනගේ කන්ස්ට්‍රක්ෂන්, E03, බිංකම,අගුණුකොලපැලැස්ස | කටුවන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඇප තැන්පත් හා කාර්ය සාධන ඇපකරය ලබා ගැනීම<br>• ලංසු ඇපකරය සඳහා- රු.25000.00<br>• කාර්ය සාධන ඇප තැන්පතුව- රු.218364.12 | 243364.12 |
| 87. | සමගි ගොවි සංවිධානය,තල්වත්ත | තල්වත්ත මොරකන්දගන්න මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම<br>• 10% අතරදවුම් මුදල- රු.18065.91 | 162593.22 |
| 88. | එක්සත් ගොවි සංවිධානය | ලබුවෙල්මුල්ල ඇරැවිගහගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම<br>• 10% අතරදවුම් මුදල- රු.8627.26 | 77645.29 |

| | | | |
|---|---|---|---|
| 89. | ලසිකා නිල්මිණි රණමුඛ මිය, කළමනාකරු,කිරම බස් කඩේ,කිරම | 2022.01.10 සිට 2022.01.20 දක්වා කටුවන බල ප්‍රදේශයේ පවත්වන ලද ඩෙංගු වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ට හා සේවක සේවකයින්ට ආහාර පාන හා සංග්‍රහ කටයුතු සඳහා ගෙවීම | 121600.00 |
| 90. | ඒ.වසන්ත මයා,තාරකා නිවස, මිමිණකොළදෙණිය,කටුවන | ඒ.වසන්ත මයා 2021.12.24 දිනMain/Mix01/2021/265 ලදුපත් අංකයෙන් කටුවන ප්‍රදේශීය සභාවේ ගල් රෝල ලබා ගැනීම වෙනුවෙන් ගෙවන ලද මුදල එම සේවාව සිදු කර ගත නොහැකි වූ බැවින් නැවත ගෙවීම | 4500.00 |
| 91. | ඇවරෝ ට්‍රේඩින්,116/C,මහවෙල පාර,දික්වැල්ල | කටුවන ආදාහනාගාරයේ අක්‍රිය වී ඇති තරාදිය අළුත්වැඩියා කිරීම | 32500.00 |
| 92. | මංකර හාඩ්වෙයාර් ස්ටෝර්ස්, කටුවන පාර,මිද්දෙනිය | පෙර පාසල්වල අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන තීන්ත ඇතුළු ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් | 115650.00 |
| 93. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 252-6508 කැබ රථයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 9000.00 |

ඉහත වවුචර් අංක 01 සිට 93 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1. කටුවන ප්‍රාදේශීය සභාවේ, කටුවන ප්‍රධාන කාර්යාලය සඳහා නිලධාරී පුටු 02ක්ද, පාරිභෝගික පුටු 06 ක්ද,කටුවන පුස්තකාලය සඳහා නිලධාරී පුටු 02 ක්ද , මිද්දෙනිය උප කාර්යාලය සඳහා කාර්යාලීය මේස 07 ක්ද, නිලධාරී පුටු 08 ක්ද, කුඩාම ප්‍රමාණයේ computer table 02 ක්ද ලබා ගැනීමට සුදුසු යැයි යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

සභාපතිතුමණි, මේ වාර්තාවේ වරිපනම් කටයුතු සඳහා ගෙවීම කිරීම් කරලා තියෙනවා. ඒ සඳහා ගත්තේ සභාවේ සේවකයින්ද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපිට ඒ කටයුතු සඳහා සේවකයින් මදි නිසා මෙහි පුහුණුව සඳහා පැමිණි ළමයෙක් අපි පුහුණුවෙන් පසුව මේ කාර්යයන් සඳහා යොදා ගත්තා. ඒ සඳහා ගෙවීම් කරන්න පළාත් පාලන කොමසාරිස් හරහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගත්තා. මේ ගෙවීම් වලට අදාළ මුදල තීරණය කළේ දිස්ත්‍රික් මිල කමිටුව මගින්.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මෙම වාර්තාවෙහි යෝජනා කරලා තියෙනවා නිලධාරීන් සඳහා මේස සහ පුටු මිලදී ගැනීමට . නමුත් ඒවා ස්ථාන ගත කරන්න ඉඩ පහසුකම් තියෙනවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඉඩ පහසුකම් ප්‍රමාණවත් නැහැ. නමුත් සංවර්ධන නිලධාරීන් 08 දෙනෙක් සමණ පසුගිය දිනවල අලුතින් ආවා. අපි ඒ අයට මේසයක් සහ පුටුවක් ලබා දෙන්න අවශ්‍යයි.

ඒ අනුව මුදල් කමිටු වාර්තාවේ අංක 01 සිට 93 දක්වා වූ වවුචර් ගෙවීම් හා ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකාග්‍රතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 ජනවාරි මස

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ ජනවාරි මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.495250.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 57670.00ක වියදම් දරා ඇති අතර ශුද්ධ ආදායම රු.437580.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජී.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

අපේ තොග පොළ ආදායම අඩුයි නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

පොළට බඩු එන්නෙ නැහැ. දැන් වෙළඳුන් වාහන වලින් ගෙදරට ඇවිත් බඩු එකතු කර ගෙන යනවා.

ඒ අනුව 2022 ජනවාරි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකාග්‍රතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2021 දෙසැම්බර් හා 2022 ජනවාරි මස

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2021 දෙසැම්බර් මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:779570.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව , පියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 1147561.00 ක වියදමක් දරා ඇත. ඒ අනුව මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 367991.00ක අලාභයක් ලබා ඇත.

එමෙන්ම සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 ජනවාරි මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:757250.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,පියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 339982.00 ක වියදමක් දරා ඇත. ඒ අනුව මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 417268.00ක ලාභයක් ලබා ඇත.

ඒ අනුව 2021 දෙසැම්බර් මස හා 2022 ජනවාරි මස යන්ත්‍රෝපකරණ ව්‍යාපෘති වාර්තා සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 දෙසැම්බර් හා 2022 ජනවාරි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 – 4 .ඉන්ධන වැයවීම පිළිබඳ වාර්තාව - 2022 ජනවාරි</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා මැයි මස රු.459963.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජනවාරි මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

**<u>06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2021 දෙසැම්බර් මස</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2021 දෙසැම්බර් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු. 4681348.16 ක් වන අතර මාසික වියදම රු.1948112.21 ක් වේ. ඒ අනුව මාසික ලාභය රු. 2733235.95 කි. ඒ අනුව දෙසැම්බර් මාසයට අදාල ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 දෙසැම්බර් මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2021 දෙසැම්බර් මස</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2021 දෙසැම්බර් මස වන විට ආරම්භක හිඟය රු: 8593779.97 ක් වන අතර දෙසැම්බර් මස අවසාන හිඟය රු: 8129371.97ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 464408.00කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සුගත් සරම්ගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 - 7. කර්මාන්ත කමිටු වාර්තාව - 2022.01.28 වන දින</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.02.28 දින පැවති කාර්මාන්ත කමිටු රැස්වීමේදී 2022 වර්ෂයේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත කර්මාන්ත වලට අදාළ ව ගොවි සමිති තෝරා ගැනීම මෙහිදී සාකච්ඡා විය. එය අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01. හඳුගල එපිටගමහේන පාර සංවර්ධනය කිරීම් කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු හඳුගල ගැමුණු ගොවි සමිතියට ලබාදීම සුදුසු බව

02. හොමඩිය වේකරියගොඩ කාඹි මාර්ගය,මැදකන්ද දොලේදෙණිය මාර්ගය කපා සකස් කිරීම මැදකන්ද පැරකුම ගොවි සංවිධානය ලබාදීම

03.හොරේවෙල ගොරක මුදුන පාර සහ හොරේවෙල රාජපක්ෂ මහතාගේ නිවස අසල යගල්දෙණිය මාර්ගය සකස් කිරීම හොරේවෙල පුබුදු ගොවි සමිතියට ලබා දීම

04. ඌලුහිටියාව දුවනගෙදර ගම්මායිම අකුරු මාර්ගය සංවර්ධනය කිරීම ඌලුහිටියාය පැරකුම් ගොවි සංවිධානයට ලබා දීම

05. කරමැටිය බින්තැන්න මද්වංගල ගෙදර මාර්ගය,පන්අඩුගොඩ මාර්ගය සංවර්ධනය කිරීම බින්තැන්න ගොවි සංවිධානයට ලබා දීම සුදුසු බව

06. තල්වත්ත මොරකන්දගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම තල්වත්ත සමගි ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

07.රණසිංහගොඩ 18 කණුව පුහුල්හේන මාර්ගය,ගොවිජන සේවා මධ්‍යස්ථානය අසලින් වෙන්දේසිවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම රණසිංහගොඩ ගැමුණු ගොවි සමිතියට ලබාදීම සුදුසු බව

08.විදපොළ තිත්තලයාය දෙණිය කන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම විදපොළ මනුවෙනමුතු ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

09. විදිකන්ද ග්‍රාම නිලධාරි වසගම් ජල පොම්පාගාරයේ සිට අක්කර 15 දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම විදිකන්ද සමගි ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

10.ඇක්මලපිටිය පූජා ශාලාව අසල සිට පනුවන්කැයාය තරහා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ඇක්මලපිටිය පුබුදු ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

11.උඩ අළුපොත්දෙණිය හැඩිගෙදර පාර,පහළ අලුපොත් නිවිතිගලයාය මාර්ගය සංවර්ධනය කිරීම පහළ අළුපොත්දෙණිය මහසෙන් ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

12. නවද තල්වත්ත මිණිරන්පොළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම තල්වත්ත සමගි ගොවි සංවිධානයට ලබා දීම සුදුසු යැයි මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් වූ යෝජනා සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව විවාදීත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 14,16 වාර්තා

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 14 ,16 වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම

2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
3. 0072633606- කර්මාන්ත ගිණුම
4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම

- ප්‍රා.ස. 14 2021 දෙසැම්බර් හා 2022 ජනවාරි මස ඒකාබද්ධ වැය සාරාංශය
- ප්‍රා.ස. 16 2021 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජනවාරි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස 14 හා 16 සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මේ අවස්ථාව සඳහා අපේ පළාත් පාලන කොමසාරිස් තුමිය වන සේනක පල්ලියගුරුගේ මැතිතුමින් පැමිණ සිටිනවා. එතුමාගේ පළාත් පාලන ආයතනයන්හි නිරීක්ෂණ චාරිකාවක් අතරතුර කවුවන ප්‍රාදේශීය සභාව මෙන්ම අපේ කොම්පෝස්ට් අංගනය නිරීක්ෂණය සඳහා තමයි පැමිණ සිටින්නේ. මාගේ විශේෂ ආරාධනාව පිළිගනිමින් එතුමාගේ පැමිණීම අපට ඉතා ගෞරවයක් වන අතර මේ අවස්ථාවට ඔබතුමන්ව පිළිගනිමින් මෙය කාරක සභා අවස්ථාවක් කොට එතුමන්ට අප වෙනුවෙන් යමක් පැවසීමට ආරාධනා කරනවා.

## පළාත් පාලන කොමසාරිස් සේනක පල්ලියගුරුගේ මැතිතුමා

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. මම මේ අවස්ථාව ඉතා ගෞරවයක් කොට සලකනවා. ඔබතුමන්ලා සමග මේ ආකාරයට කථා කිරීමට ලැබීම පිළිබඳව. අපේ පළාත් පාලන ආයතනයන්හි ගරු සභාපතිවරුන් ඇතුළු මන්ත්‍රීමණ්ඩලය විශාල සේවාවක්, කැප කිරීමක් ,කාර්ය භාරයක් පසුගිය කාල සීමාව තුළ සිදු කළා. 2020 හා 2021 වර්ෂයන්හි සිට කොවිඩ් වසංගත තත්වය හමුවේ ජනතාව වෙනුවෙන් සහන ලබා දෙමින් විශාල වැඩපිළිවෙළක් දියත් කරන්නට ඔබතුමන්ලාට හැකියාවක් ලැබුණා. රට වසා තිබූ කාලය තුළ විෂබීජ හරණය, එන්නත්කරණය, භාණ්ඩ නිවෙස් වලට බෙදා හරින කටයුතු ආදියේදී දේශපාලන අධිකාරිය විශාල මැදිහත් වීමක් සිදුකළා. මුලින්ම කොවිඩ් තත්වය තුළ අපේ මහජන නියෝජිතවරුන් අපනීප වීමට හේතුව වුණෙත් මේ තත්වය . ගත වූ වසර හතර තුළ මහජන නියෝජිතවරුන් කෙරෙහි ජනතාව පැත්තෙන් චෝදනා ආදිය ඉතා අඩු කාලයක් වුණා. ඔබතුමන්ලා ගම් වල මිනිසුන් සමග ඉතා සුහදශීලීව කටයුතු කළ කාලයක් වුණා. ඔබතුමන්ලාගේ දැනුම වැඩිකිරීම පැත්තෙන් මේ රටේ තිබුණ සෞඛ්‍ය තත්වය මත අපිට දෙයක් කරන්න බැරි වුණා. ඒ දේවල් මගින් සර්ව සම්පූර්ණ පළාත් පාලන මන්ත්‍රීවරයෙකු බිහිකරන්න පුළුවන්. ගමේ යම් සේවාවක් කරමින් සියලු පාර්ශව සමග සුහදශීලීව කටයුතු කරමින් සරල, කම්පය අඩිත සරල දිවිපැවැත්මක් ඇති මහජන නියෝජිතවරුන් තමයි මේ පළාත් පාලන ආයතනයන්හි ඉන්නෙත්. ඒ අයගේ පැවැත්ම ස්ථිරයි. එම භූමිකාව හඳුනාගෙන වැඩකරන පිරිසක් තමයි මේ ඉන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ජනතාව සමග ගැටෙන්නේ නැති තරම්. ඒත් ඔබට ඒ අවස්ථාව ලැබෙනවා. පසුගිය කාලය තුළ සභා ආදායම් ඉතාම අඩු වුණා. පොළ ආදායම්, කඩ කුලී, ටෙන්ඩර් ආදායම් ආදිය අඩු වෙද්දී සභාවේ ආදායම් කටයුතු කළමණාකරණය කර ගනිමින් අපේ සභාපතිවරුන් මේ ජනතාව වෙනුවෙන් සේවය කළා. ඔබ තුමන්ලාට අවසර අවස්ථාවක් ලැබිලා තියෙනවා. අපි ඉදිරියේදී දැනුම වර්ධනය කරන වැඩමුළු කිහිපයක් සඳහා අවස්ථාව ලබා ගන්න බලමු.

අනෙක් කාරණය විදියට කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිළිබඳව මගේ දැඩි උනන්දුවක් තියෙනවා. ඒ සඳහා අපි සැලැස්මක් සකස් කළා. දිස්ත්‍රික්ක තුනම අතරින් හම්බන්තොට පළමු තැන සිටිනවා. ඒ අතරින් කටුවන ප්‍රාදේශීය සභාව ඉතා ඉහළ මට්ටමක ඉන්නවා. අපේ සභාපතිතුමාට ඒ පිළිබඳ හොඳ දැනුමක් තියෙනවා. එතුමා ඒ පිළිබඳ හදාරලා, ඉගනගෙන, පෞද්ගලිකව ඒ කටයුත්තට සම්බන්ධ වෙනවා මම දැක්කා. ඒ සම්බන්ධයෙන් මම සකස් කරන ලද පරිගණක ඉදිරිපත් කිරීමක් මගින් ගරු ජනාධිපතිතුමන් පැමිණි අවස්ථාවක ඉදිරිපත් කිරීමක් කළා. අතිගරු ජනාධිපතිතුමන් ඒ ව්‍යාපෘතිය සඳහා අපට මිලියන 100ක් ලබා දුන්නා. කටුවන ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මිලියන 4ක් මම වෙන් කළා. අනෙක් ආයතන අපිට බලන්න පුළුවන් නම් අපේ දැනුම තවත් වර්ධනය වෙනවා. විවිධ සභාපතිවරුන් මේ කාර්යයේදී මට හමු වෙලා තියෙනවා. අධ්‍යාපන සුදුසුකම් වලට වඩා මහජන කුසලතාවය ඉතා වැදගත්. ඒ අය නැත්නම් අපිට මේ ආයතන පද්ධතිය පවත්වන්න අමාරුයි. මේක වෙනමම කලාවක් ලෙස තමයි මම දකින්නේ. ඔබතුමන්ලාට ඕනෑම අවස්ථාවක මට කතා කරන්න පුළුවන්. සියලු දෙනාටම ස්තූතියි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

පළාත් පාලන කොමසාරිස්තුමන්, ගරු උපසභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ පළාත් පාලන කොමසාරිස් තුමන් මේ අවස්ථාවට සම්බන්ධ වීම අපිට ලොකු ගෞරවයක්. සියලුම ප්‍රාදේශීය සභා අතුරින් කොම්පෝස්ට් නිෂ්පාදනය වෙනුවෙන් තත්ත්ව සහතිකයක් ලබා ගැනීමට අපි කටයුතු කළා. එය අපි පමණයි ලබා ගත්තේ. අපිට මේ ව්‍යාපෘතිය සඳහා තවත් කොම්පෝස්ට් අවශ්‍යයි. ඒ සඳහා ගාල්ල මොන්ටෝරියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙන් අපිට කොම්පෝස්ට් ලබා ගන්න පුළුවන් නම් ඒවා අපිට අවශ්‍ය විදියට සකස් කර ගන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා ඔබතුමන්ගෙන් ඉල්ලීම කරනවා. මෙම කොම්පෝස්ට් හොඳ තත්වයෙන් සකස් කර ඉදිරියේ වගා කටයුතු සඳහා ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම මේ අවස්ථාව සඳහා ඔබතුමන්ගේ පැමිණීමට අපි ස්තූති වන්ත වෙනවා.

**<u>08. වෙනත් යෝජනා</u>**

**<u>08-1. පරිසර පොදු පහසුකම් කමිටු යෝජනා ඉදිරිපත් කිරීම</u>**

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

පරිසර පොදු පහසුකම් කමිටු යෝජනා සභාවට ඉදිරිපත් කිරීම මැයෙන් පරිසර නිළධාරී විසින් 2022.02.15 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022.01.07 දින පරිසර හා පොදු පහසුකම් කමිටුවේ යෝජනා කර ගන්නා ලද පහත යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ස්ථාන වල අවිධිමත් ලෙස කැළි කසළ බැහැර නොකිරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා එම ස්ථාන වල කැළි කසළ බැහැර කිරීම සපුරා තහනම් බව ප්‍රකාශ කරමින් අඩි දෙකේ දැන්වීම් පුවරු සවි කිරීමටත් , එම දැන්වීම් පුවරු වල සභාවේ දුරකථන අංකය හා අවවාදාත්මක වැකි ඇතුළත් කිරීම.

02.කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෞද්ගලික හා රජයේ ආයතන මගින් බැහැර කරනු ලබන කැළි කසළ මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කොම්පෝස්ට් බඳුන් එම ආයතන වලට ලබා දීමට මධ්‍යම පරිසර අධිකාරියෙන් ප්‍රතිපාදන ලබා ගැනීම.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ජී.සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

පසුගිය දිනක පරිසර කමිටුව ගරු උප සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වුණා. එහිදී ගත්තු තීරණ කිහිපයක් තමයි මේ කියන්නේ.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මෙහි දැන්වීම් පුවරු වල අවවාදාත්මක වැකි යොදගෙන කරමින් සකස් කරන්න යෝජනා කරලා තියෙනවා. ඒවා කුමන ප්‍රමාණ වලින් සකස් කරනවද?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මහජනතාවට පෙනෙන පරිදි සකස් කරන්න වෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

සභාපතිතුමණි, හෝරගොල්ලයාය මාර්ගයේ ඇගලුම් කර්මාන්තය අසළ මිනිස්සු කුණු දානවා. ඒ මාර්ගයේ දැන්වීම් පුවරු ටිකක් සවි කරලා එය නවත්වන්න ඕන. කැමරාවක් සවි කරන්න පුළුවන් නම් ගොඩක් හොදයි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මිනිස්සු මේ ආකාරයට අවිධිමත්ව කුණු බැහැර කිරීම පුරුද්දක් කරගෙන තියෙනවා. අපි මේ සඳහා මූලික පියවරක් විදියට අවවාදාත්මක පුවරු සවි කිරීම කරමු. නමුත් ජනතාව ඒ සඳහා අවධානය යොමු නොකරනවා නම් අපිට පුළුවන් ඒ සඳහා නීතිමය පියවරක් ගැනීමට අවශ්‍ය තීරණයක් ගන්න.

ඒ අනුව පරිසර පොදු පහසුකම් කමිටු යෝජනා සභාවට ඉදිරිපත් කිරීම මැයෙන් පරිසර නිලධාරි විසින් 2022.02.15 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022.01.07 දින පරිසර හා පොදු පහසුකම් කමිටුවේ යෝජනා කර ගන්නා ලද පහත යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

01.කටුවන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ස්ථාන වල අවිධිමත් ලෙස කැළි කසළ බැහැර නොකිරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා එම ස්ථාන වල කැළි කසළ බැහැර කිරීම සපුරා තහනම් බව ප්‍රකාශ කරමින් අඩි 6දෙකේ දැන්වීම් පුවරු සවි කිරීමටත් , එම දැන්වීම් පුවරු වල සභාවේ දුරකථන අංකය හා අවවාදාත්මක වැකි ඇතුළත් කිරීම

02.කටුවන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පෞද්ගලික හා රජයේ ආයතන මගින් බැහැර කරනු ලබන කැළි කසළ මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කොම්පෝස්ට් බඳුන් එම ආයතන වලට ලබා දීමට මධ්‍යම පරිසර අධිකාරියෙන් ප්‍රතිපාදන ලබා ගැනීම.

## 08-2. කටුවන ප්‍රාදේශිය සභාවට අයත් වාහන අළුත්වැඩියාව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ( පුනරාවර්ථන 2021) - කටුවන ප්‍රාදේශිය සභාවට අයත් වාහන අළුත්වැඩියාව මැයෙන් අංක කප්‍රාස 07 හා 2022.02.15 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පළාත් පාලන අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති රුපියල් මිලියන දෙකක ප්‍රතිපාදන මුදලට අමතරව අනුමත ඇස්තමේන්තුව අනුව ඇටීමට සිදු වන අමතර මුදල වන රු. 171000.00ක මුදල සභා අරමුදලින් දැරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ජී. ගාමිණී මැතිතුමා. එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම ප්‍රතිපාදන මගින් අපි ප්‍රාදේශිය සභාවට අයත් වාහන දෙකක් වන 53-1634 හා 252-6508 යන කැබ් රථ අළුත්වැඩියා කළා. ඒ සඳහා අපිට ලැබුණ ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවුණහොත් ඉතිරි මුදල සභා අරමුදලින් ගෙවීමට එකඟව තමයි අපි ඒ කාර්යය කළේ.

ඒ අනුව පළාත් පාලන අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය සභාවට අයත් වාහන අළුත්වැඩියාව සඳහා ලබා දී ඇති රුපියල් මිලියන දෙකක ප්‍රතිපාදන මුදලට අමතරව අනුමත ඇස්තමේන්තුව අනුව දැරීමට සිදුවන අමතර රු. 171000.00 ක මුදල සභා අරමුදලින් දැරීම සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-3 පරිවර්තන ගමන් වියදම් ලබා ගන්නා වාහන සම්බන්ධව</u>**

**<u>ගරු ප්‍රා.ස.ම. නිශාන්ත කුමාර මැතිතුමා.</u>**

පරිවර්තන ගමන් වියදම් ලබා ගන්නා වාහන සම්බන්ධවයි මෙයෙන් පරිසර නිළධාරි ජේ.ජී.අනුර මයා සහ තාක්ෂණ නිළධාරි ඩබ්.ආර්.රසික කුමාර මයා විසින් 2022.02.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ලබා දී ඇති පහත අංක දරණ යතුරු පැදි රාජකාරි කටයුතු සඳහා භාවිතා කිරීමටත් ඒ සඳහා වන දීමනා ගෙවීම සුදුසු බවත් යෝජනා කරමි.

01.BBR 5765

02.BBR 9287

ගරු ප්‍රා.ස.ම. රමණී හල්පෙගමගේ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

මෙම නිළධාරීන් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වල යෙදෙන්නේ ඒ අයට ලබා දුන්න යතුරු පැදියෙන්. ඒ සඳහා ගමන් වියදම් ලබා ගැනීමට නම් එම යතුරු පැදි සඳහා අනුමැතියක් ලබා ගැනීම අවශ්‍යයි.

ඒ අනුව පරිවර්තන ගමන් වියදම් ලබා ගන්නා වාහන සම්බන්ධවයි මෙයෙන් පරිසර නිළධාරි ජේ.ජී.අනුර මයා සහ තාක්ෂණ නිළධාරි ඩබ්.ආර්.රසික කුමාර මයා විසින් 2022.02.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ලබා දී ඇති පහත අංක දරණ යතුරු පැදි සඳහා ගමන් වියදම් ගෙවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08- 4 . 2022 අයවැය යෝජනා මගින් ලබාගත් මාර්ගයන් සංශෝධනය කිරීම - හොරවින්න කොට්ඨාශය</u>**

**<u>ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා</u>**

2022 අයවැය යෝජනා මගින් හොරවින්න කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද පැපොල්ගහගොඩ සිට පුහුල්හේන්ගොඩ දක්වා මාර්ගය වෙනුවට හොරොක්ගහගොඩ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා එය සංශෝධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඒ අනුව 2022 අයවැය යෝජනා මගින් හොරවින්න කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද පැපොල්ගහගොඩ සිට පුහුල්හේන්ගොඩ දක්වා මාර්ගය වෙනුවට හොරොක්ගහගොඩ මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සම්බන්ධවත් ඒ සඳහා තාක්ෂණ නිළධාරි මගින් ඇස්තමේන්තු සකස් කර සංවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-5. ඇල ඉවුර - පහළවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා**
**ගරු ප්‍රා.ස.ම.ඊ.බී.ඉන්දික මැතිතුමා.**

පහලවත්ත ග්‍රාම නිළධාරී වසමට අයත් ඇලඉවුර පහළවත්ත මාර්ගය ඉතා අබලන් තත්වයේ පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.බී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

තාක්ෂණ නිළධාරී මගින් ඇස්තමේන්තුවක් සකස් කරලා ඉක්මණින් සංවර්ධන කටයුතු ආරම්භ කරන්න.

ඒ අනුව පහලවත්ත ග්‍රාම නිළධාරී වසමට අයත් ඇලඉවුර පහළවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.250000.00ක ප්‍රතිපාදනයන්ට යටත්ව තාක්ෂණ නිළධාරී මගින් ඇස්තමේන්තු සකස් කර එය සභා අරමුදලින් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-6. 2022 අයවැය යෝජනා මගින් ලබාගත් මාර්ගයන් සංශෝධනය කිරීම - වෙළදගොඩ කොට්ඨාශය**
**ගරු ප්‍රා.ස.ම.අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා.**

2022 අයවැය යෝජනා මගින් වෙළදගොඩ කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද වැලිගහමණ්ඩිය මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්වයක් ඇති වී ඇති බැවින් ඒ වෙනුවට බටගස්ස මිරිස්වත්ත හේන්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම ලෙස එය සංශෝධනය කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අයවැය යෝජනා මගින් වෙළදගොඩ කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද වැලිගහමණ්ඩිය මාර්ගය වෙනුවට බටගස්ස මිරිස්වත්ත හේන්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සම්බන්ධවත් ඒ සඳහා තාක්ෂණ නිළධාරී මගින් ඇස්තමේන්තු සකස් කර සංවර්ධනය කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-07. 2022 අයවැය යෝජනා මගින් ලබාගත් මාර්ගයන් සංශෝධනය කිරීම - උලහිටියාව කොට්ඨාශය**
**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඒ.සංජීව මැතිතුමා.**

2022 අයවැය යෝජනා මගින් උලහිටියාව කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද උලහිටියාව නැගෙනහිර වසමේ මාරගහවත්ත මාර්ගය වෙනුවට උලහිටියාව ඉවත ගෙදර මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

සංශෝධිත මාර්ග සඳහා කඩිනමින් ඇස්තමේන්තු සකස් කරලා මේ සංවර්ධන කටයුතු සිදු කරන්න.

**08-10. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම එච්.ඒ.ප්‍රදීපා නිසංසලා මැතිතුමිය**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙගමගේ මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම යුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. බී.රාජපක්ෂ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ගිය සභාවේදී තීරණය කර ගත් පරිදි මිද්දෙනිය පුරාණ විහාරස්ථානයේ පැවති ජල බිල් හිගය සම්බන්ධයෙන් කථා කරන්න සාකච්ඡාවක් කැඳෙව්වා. ඒ සදහා අපේ සනත් මන්ත්‍රීතුමන්, ගාමිණි මන්ත්‍රීතුමන් සහභාගී වුණා. එම ජල බිල් හිගය මේ වන විට රු. 452957.50ක් වන අතර ඒ සදහා විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ විසින් රු 100000.00 ක මුදලක් ගෙවන බවත් ඉතිරි මුදල ගරු ප්‍රා.ස.ම.සනත් මැතිතුමන්ගේ තුන් මසක මන්ත්‍රී දීමනාවෙන් සහ ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමන්ගේ එක් මසක මන්ත්‍රී දීමනාවෙන් පියවීමට මූලිකව එකගතාවය ලබා දුන්නා. එසේම ඉතිරි මුදල ගරු ප්‍රා.ස.ම.සනත් මන්ත්‍රීතුමන් හා ප්‍රදේශයේ මැති ඇමතිවරුන්ගේ සහයෝගයෙන් පියවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බවටත් එකග වී සාකච්ඡාව අවසන් කළා. අපි ඒ සම්බන්ධයෙන් සිදු කළ කාර්යය සාර්ථක බව තමයි මගේ අදහස.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මම මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කරමින් පවතිනවා. අපි ගැටළුව අවසන් කිරීමට කටයුතු කරන බව මම සතුටින් මතක් කරනවා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙය කාලයක් තිස්සේ කථා බහට ලක් වූ ගැටළුවක් . නමුත් අද වන විට අපි මේ සාකච්ඡාව මගින් යම් නිශ්චිත තීරණයකට එළඹීම සම්බන්ධයෙන් මම ඉතාම සතුටට පත් වෙනවා. අපිට යම් අවසානයක් දකින්න පුළුවන් විදියේ සාකච්ඡාවක් සිදු කළා. මට අත්‍යවශ්‍ය හේතුවක් මත මේ සදහා සහභාගී වීමට නොහැකි වුණත් ගරු ප්‍රාදේශීය සභාවේ සභාපති වරුන් හතරදෙනෙකුගේ කාලයේ සිට පැවත හා ගැටළුවක් මේ ආකාරයෙන් ඔබතුමන් යටතේ සමතයකට පත් කරන්න ලැබීම සුවිශේෂ දෙයක්. ඒ සම්බන්ධයෙන් ඔබතුමන් ඇතුළු අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට ස්තූති වන්ත වෙනවා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී බී.රාජපක්ෂ මැතිතුමිය**

උලහිටියාව නැගෙනහිර වසමේ පිහිටි මුරුත ගොඩැල්ල මාර්ගය වල් බිහි වී ඇති අතර ප්‍රදේශවාසීන්ට ඉඩම් වල එළදාව අලෙවි කර ගැනීමට යාමට හෝ ප්‍රවාහනය කර ගැනීමට හැකියාවක් නැහැ. එබැවින් මෙම මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කොට්ඨාශයය මන්ත්‍රීතුමන් සමග සාකච්ඡා කරලා මේ සදහා අවශ්‍ය කටයුතු කරන්න. කොට්ඨාශයේ මන්ත්‍රීතුමන් මේ සම්බන්ධයෙන් සොයා බලන්න.

**ගරු ප්‍රා.ස.ම. සුගත් සරම්ගේ මැතිතුමා.**

ගරු සභාපතිතුමණි, නමනැලිය තැපැල් කාර්යාලය ළග වතුර බැස යාම සම්බන්ධව ආරවුලක් තියෙනවා. එම ස්ථානයේ සභාවේ නිළධාරි මහත්වරු නිරීක්ෂණය කරලා විසදුමක් ලබා දීලා තිබුණා

ඒ අනුව 2022 අයවැය යෝජනා මගින් උලපිටියාව කොට්ඨාශයට අදාළව සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන ලද උලපිටියාව නැගෙනහිර වයමෙ මාරගහවත්ත මාර්ගය වෙනුවට උලපිටියාව දූවන ගෙදර මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සම්බන්ධවත් ඒ සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර සංවර්ධනය කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-08. වවුචර් සඳහා ගෙවීම් කිරීම</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 146 - ගැමුණු ගොවි සංවිධානය- රජගහදොළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.182651.25( 10% රඳවුම-රු.18265.13 + ගෙවන මුදල රු.164386.12)

02.වවුචර් අංක 147 - එච්.ජී.ඒ.සරත්චන්ද්‍ර , වලස්මුල්ල මෝටර්ස්, වීරකැටිය පාර, වලස්මුල්ල- කටුවන ප්‍රාදේශීය සභාව සතු 53-1634 හා 252-6508 වාහන අලුත්වැඩියාව සඳහා වැය වූ මුදල රු. 2171000.00

03. වවුචර් අංක 145 - පැරකුම් ගොවි සංවිධානය - ගල් ඇන්දගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.249724.36( 10% රඳවුම-රු.24972.44 + ගෙවන මුදල රු.224751.92)

04. වවුචර් අංක 134 - සමගි ගොවි සංවිධානය - කල්වත්ත මිණිරන්පොළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.180659.13 ( 10% රඳවුම-රු.18065.91 + ගෙවන මුදල රු.162593.22)

05. වවුචර් අංක 133 - දිලෙනතරු ගොවි සංවිධානය - දමෙතලාව මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.247020.63 ( 10% රඳවුම-රු.24702.06 + ගෙවන මුදල රු.222318.57)

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් යෝජනාව ස්ථිර කරන ලදී.
**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>**

අපි මෙම වවුචර් සඳහා ගෙවීම් කරමු.

ඒ අනුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-09. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයක් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඒ.ජී.ඉන්දික මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

ගොඩනැගිල්ල අසලින් වතුර බස්සන්න කියලා. මෙතන දෙපාර්ශවයක් අතර ප්‍රශ්නයක් තියෙනවා. මේ සඳහා විසඳුමක් දෙද්දී අර්බුදයක් ඇතිවීම වළක්වන්න පුළුවන් විදියෙ විසඳුමක් දෙන්න ඕන. ඒ සඳහා පැයි බැම්මක් බැන්දා නම් දෙගොල්ලන්ටම හානියක් නැහැ, මෙහි අනතුරක් තියන නිසා මේක අපිට ආපදා එකට යොමු කරලා විසඳුමක් හොයන්න පුළුවන්.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මේ ගැටළුව දීර්ඝ කාලීනව තිබුණු ප්‍රශ්නයක්. ආපදා එකෙන් තමයි මෙම කාණුව වහන්න තීරණය කළේ. ඔබතුමාලට මේ සඳහා විසඳුමක් ලබා දෙන්න පුළුවන්. කොට්ඨාශ සඳහා වෙන් කරන ප්‍රතිපාදන වලදී මේ ගැන අවධානය යොමු කරලා මෙය සකස් කරන්න පුළුවන්. මේක තවම උසාවි ඇලා නැහැ.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ජී.එස්.වීරසිරි මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමණි, ඔබතුමන්ලා සෑම කොට්ඨාශයකටම සෑම වසමකම මාර්ග සංවර්ධන කටයුතු කරනවා. අපි ඒ පිළිබඳ අවධානයෙන් ඉන්නවා. ඒ වගේම ඒ සම්බන්ධව සතුටුයි. නමුත් මම යෝජනා කළ කොන්කර ගේන අංගමිය මධ්‍යස්ථානය අසළ මාර්ගය සංවර්ධනය තවම සිදුකළේ නැහැ. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකළ හේතුව කුමක්ද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඒ සඳහා පසුගිය සභාවේ තාක්ෂණ නිළධාරින් මගින් ඇස්තමේන්තු සකස් කරලා කඩිනමින් සංවර්ධන කටයුතු සිදු කරන්න තීරණය කළා. ඒ සම්බන්ධව තාක්ෂණ නිළධාරී මහත්වරු සමග කථා කරලා ඒ කටයුතු සිදුකරනවාද බලන්න ඔබතුමියට පුළුවන්. එය කඩිනමින් කර ගන්න.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී බී.රාජපක්ෂ මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමණි, මීද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ පිහිටි වැසිකිළි පද්ධතිය ඉතාම ජරා ජීර්ණ මට්ටමේ පවතිනවා. එහන සිටින අයත් මේ සභාවෙන් කිහිප වතාවක් මේ සම්බන්ධව කථා කළා. ඒ සඳහා විසඳුමක් ලබා දෙන බවත් ඔබතුමා කිව්වා. පසුගිය දිනක හම්බන්තොට ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියේ විශ්‍රාමික අධ්‍යක්ෂතුමන් අපේ යාකව්ජාවකට පැමිණුනා. එතුමන් මේ සම්බන්ධව ඉතා අප්‍රසාදයෙන් කථා කළා. එතනදී අපි ඉතා අපහසුතාවයට පත් වුණා. ඒ නිසා මේ සඳහා කඩිනමින් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

එතන ඉන්න අය මේ දේවල් ආරක්ෂා කර ගන්න දැන ගන්න ඕන. දැනට වැසිකිළි පිළිසකර කරන්න ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා. ඒ අනුව ඉදිරියේදී ඒ කටයුතු සිදු කරාවී.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී යූ.ජී.ධර්මසිරි මැතිතුමා</u>**

සභාපතිතුමණි, කටුවන මැදවට පාර පැති බැම්ම හදලා සකස් කරලා තියනවා. එය කඩිනමින් සංවර්ධනය කරන්න කියලා ආපදා කළමණාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන්න.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ දිනවල සභාවේ නිළධාරීන් වරිපනම් කටයුතු සඳහා නිවෙස් වලට යනවා. එතනදී එම නිවෙස් වල ඉන්න අයට තමන් කවුද කුමන කාරණයක් සඳහා පැමිණියාද යන්න පැහැදිලි කරලා අදාල රාජකාරී කටයුතු කරනවා නම් හොඳයි. එහෙම නැත්නම් ගැටළු ඇතිවෙන්න පුළුවන්. ඒ බව ඒ නිළධාරීන් දැනුවත් කරන්න. ඒත් එක්කම මීද්දෙනිය ජනහිත ලොත්තැරියට රු. 500.00ක මුදලක් ගෙවීම සම්බන්ධව නඩු පැවරීමෙහි යම් අසාධාරණයක් නැද්ද? අපිට ඊට වඩා මුදලක් නඩු කටයුතු සඳහා ගෙවීම් කරන්න වෙනවා නේද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඔව්. මෙතන හැම වර්ෂයකම සිදු කරන වැරදි වැඩක්. අපේ නිලධාරීන් මේ සඳහා ඒ අය ළඟට යන්න අවශ්‍ය නැහැ. අපි ලියුම් යවනවා. නමුත් මෙහනදී අපේ නිලධාරීන් තුන් වතාවක් එතනට ගිහින් තියෙනවා. නමුත් අදාල මුදල ගෙවන්නෙ නැහැ. ඒ නිසා තමයි නීති මාර්ගයට යන්න වුණේ. ඔය ආකාරයෙන් කෝස්වේ ජේන්ටිස් ආයතනයේ බෝඩ් එකක් සවි කිරීම වෙනුවෙන් වසර තුනක මුදල් ගෙවලා තිබුණෙ නැහැ. මෙම නිලධාරි තුමිය ඒ සඳහා නීති මාර්ගයෙන් කටයුතු කරලා නඩුව දිනලා අදාළ මුදල් සභාව වෙත ලබා ගත්තා. ඒ නිසා අපිට හැම වෙලාවෙම ජනකාඩු ගැන හිතන්න බැහැ. රාජකාරි කටයුතු වලදී අවශ්‍ය දේවල් කරන්න වෙනවා. මේ නිලධාරීන් යම් යම් රාජකාරි කටයුතු සඳහා බැඳී ඉන්නවා. අපිට ඒ දේවල් ඒ විදියට කරන්න වෙනවා.

## 10. - ස්තූතිය හා නිමාව.

අද දින 2022 වර්ෂයේ පෙබරවාරි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූන අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිලධාරිතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දවසෙ සභාවෙ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 01.30 ට පමණ සභා කොමෝ සතුටින් විසිර ගියහ.

..............................

අයි. ජී. මහින්ද

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.